**ශීර්ෂ 321 - නැගෙනහිර පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය**

---

## 1 දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

නැගෙනහිර පළාතේ ජනතාවගේ බලාපොරොත්තු හා අපේක්ෂාවන් තෘප්තිමත් වන අයුරින් ඉතා යහපත් හා සාමකාමී ජීවන තත්ත්වයක් සැපයීම.

### 1.2 මෙහෙවර

පළාත තුළ සාමාජීය, සංස්කෘතික දායාද හා ජනවර්ග අතර සහයෝගීතාව ඇති කිරීම කෙරෙහි විශේෂ අවධානය ඇති කරමින්, යහපත් පාලනයක් තුළින් මානව හා භෞතික සම්පත් ඵලදායිතාව කාර්යක්ෂම ලෙස භාවිතයට ගනිමින් නැගෙනහිර පළාතේ ජීවත්වන ජනතාවට චිරස්ථායී හා ගෞරවනීය තත්ත්වයක් ඇති කිරීමට සහතිකවීම.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

නැගෙනහිර පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.21,091,408,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.18,148,294,014 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.2,943,113,986 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 16,114,708,000 | 13,783,708,000 | 2,331,000,000 | 14 |
| මූලධන | 4,976,700,000 | 4,364,586,014 | 612,113,986 | 12 |
| එකතුව | 21,091,408,000 | 18,148,294,014 | 2,943,113,986 | 14 |

මධ්‍යම රජය විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ උපයෝජනය කර තිබුණු අතර පළාත් සභාවේ අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.